# දැයේ නිර්මාණකරුවන් දිරිගන්වන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

**පුෂ්පමාලී ගුණරත්න**
ශාස්ත්‍රවේදී ගෞරව (සිංහල)
පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ජන සන්නිවේදන)
සහකාර වැඩසටහන් නිලධාරී (ප්‍රකාශන)
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

**නිර්මාණශීලි හැකියාවන්ගෙන් පිරිපුන් ජනකොටසක් ශ්‍රී ලංකාව සතුවීම වාසනාවකි. නමුත් එම හැකියාවන් තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට කොතරම් දායකත්වයක් සැපයීමට ඔවුන්ට හැකියාව ලැබී තිබේද? ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගෙන් අපේ රටට ඵලදායි ලෙස දායකත්වයක් ලබාදීම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මූලික පරමාර්ථයයි.**

මේ සඳහා අප කොමිසම විශේෂ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මකකර ඇත. ඒ අතර,

* පාසල්, විශ්ව විද්‍යාල, කාර්මික විද්‍යාල හා ග්‍රාමීය ප්‍රදේශවල තරුණ කණ්ඩායම් සඳහා යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීම.
* කලාප, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් නව නිපැයුම් ප්‍රදර්ශන හා තරඟ පැවැත්වීම.
* දේශීය නව නිපැයුම් සඳහා ජනාධිපති හා ජාතික සම්මාන ප්‍රදානය කිරීම.
* පේටන්ට් බලපත්‍ර ලබාගැනීම සඳහා තාක්ෂණික උපදෙස් ලබා දීම.
* පර්යේෂණ පහසුකම් ලබාදීම.
* ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශන සඳහා නව නිපැයුම්කරුවන් යොමු කිරීම.
* ග්‍රාමීය ප්‍රදේශවල තරුණ කොටස් හා කුඩා හා මධ්‍ය ව්‍යවසායකයන් සඳහා නව නිපැයුම් හා නව තාක්ෂණය හඳුන්වාදීම.
* නව නිපැයුම් පුවත් සඟරාව, රූපවාහිනී වැඩසටහන් හා පුවත් පත් ලිපි මගින් නව නිපැයුම්කරණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම.
* පුස්තකාලයක් පවත්වාගෙන යාම.
* නව නිපැයුම් ප්‍රදර්ශනාගාරයක් පවත්වා ගෙන යාම සඳහා කටයුතු කිරීම

ප්‍රධාන ස්ථානයක් ගනී.

**මෙම කාර්යයන් සමස්ත සමාජය තුළ සාර්ථකව ක්‍රියාත්මක කිරීම තුළින් අනාගත ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගෙන් උපරිම දායකත්වය ලබාදීම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගෙන් කොමිසමේ හා ව්‍යවසාය සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මූලික අරමුණක් වී තිබේ.**

වර්තමානයේ මේ සඳහා නව නිපැයුම්කරුවන්ගෙන් ලැබෙන දායකත්වය හා සහයෝගය ඉතා ඉහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ නව ආර්ථික සංවර්ධන වැඩපිළිවෙල සඳහා මෙය විශාල දායකත්වයක් සපයනු ඇත.

ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිටම ප්‍රසිද්ධ වූයේ කෘෂිකාර්මික රටක් ලෙසයි. තේ, පොල්, රබර් හා වී වගාව ප්‍රධාන ආර්ථික බෝග වාගවන් වූ අතර, කුරුඳු, ගම්මිරිස්, කජු ආදී වගාවන් සුළු අපනයන භෝග ලෙස හඳුන්වාදෙනු ලැබිය. අතීතයේදී ශ්‍රී ලංකාව ඌන සංවර්ධිත රටක් ලෙස හැඳින්වූවද ලෝකයේ අනෙක් රටවලට වඩා කෘෂි ආර්ථික බෝග වලින් ස්වයංපෝෂිතව පැවති රටක් ලෙස අභිමානයෙන් ප්‍රකාශ කිරීමට අපට හැකියාව ලැබුණි. වර්තමාන ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය විශාල පිරිහීමකට පත්ව තිබුනද අනාගත ශ්‍රී ලංකාව නැවත ස්වයංපෝෂිත රටක් බවට පරිවර්තනය කළ හැක්කේද මෙම කෘෂිකර්මාන්තයෙන්ම බව අප විසින් වටහාගත යුතු කාලය එළඹ තිබේ.

“ තේ ” යනු රසවත් පානයකි. ප්‍රධාන අපනයන භෝගයකි. ශ්‍රී ලංකාවට කීර්තියක් ලබාදුන් හා ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය තහවුරු කරන ලද වෙළඳ භාණ්ඩයකි. “Ceylon Tea” යන නාමය ඇසූ සැනෙකින් ලෝකයේ ඕනෑම රටක් එය ශ්‍රී ලංකාවේ නිෂ්පාදනයක් බව හොඳින් දනී. එයට ආදරය කරන පිටරැටියෝ බොහෝය.

රසවත් පානයක් ලෙස තේ අප පරිභෝජනය කළත් තේ දළු නෙලීමේ කාර්යයේදී ඒ සඳහා ශ්‍රමය වැයකරන කම්කරුවන් විසින් විඳින දුක් කන්දරාව අති විශාලයි. මේ පිළිබඳ හොඳ අවබෝධයක් තියෙන්නේ මෙම

කර්මාන්තයේ යෙදී සිටින පුද්ගලයන්ට පමණයි. ආචාර්ය එම්.ඒ. විජේරත්නයන් මේ සඳහා ගත හැකි හොඳම නිදර්ශනයයි. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් හඳුනාගත් සාර්ථක හා රටට ඵලදායී ලෙස නව නිපැයුම් බිහිකිරීමේ යෙදී සිටින නව නිපැයුම්කරුවෙකු ලෙස ආචාර්ය විජේරත්නයන් හඳුන්වා දිය හැකිය.

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සඳහා ඔහුගේ දායකත්වය ඉතා ඉහළ මට්ටමක පවතී.

- ප්‍රධාන වශයෙන්ම තේ වගාව පිළිබඳ ප්‍රධාන පර්යේෂණ ව්‍යාපෘති ගනරකට නායකත්වය සැපයීම
- තේ නෙලීම හා තේ පඳුරු කප්පාදු කිරීම පිළිබඳ වූ යන්ත්‍ර සූත්‍ර සැලසුම් කිරීම හා ඒ පිළිබඳ පර්යේෂණ සිදුකිරීම
- තේ වගාව, වැවිලි කර්මාන්තය පිළිබඳ විධායක සභාව නියෝජනය කිරීම, කෘෂි විද්‍යා සිසුන් හා ඩිප්ලෝමාධාරීන් පුහුණු කිරීම
- විද්‍යාවේදී උපාධි අපේක්ෂකයන්ගේ පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම
- රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ විධායක මණ්ඩල සාමාජික හා බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ආචාර්ය විජේරත්න සේවය කරයි.

මෙසේ ඔහු ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ සංවර්ධනය සඳහා විශාල සේවාවක් ඉටු කරන අතර, ආචාර්ය විජේරත්නයන් ශ්‍රී ලංකාවේ තේ වගාවේ පවතින ගැටළු හඳුනාගනිමින් තේ කර්මාන්තය නංවාලීම සඳහා ප්‍රායෝගිකව භාවිත කළ හැකි යාන්ත්‍රික මෙවලම් කිහිපයක් නිර්මාණය කරනු ලැබීය.

**ඔහු විසින් හඳුනාගත් එක් ගැටළුකාරී ක්ෂේත්‍රයක් වන්නේ තේ දළු නෙලීමේදී කම්කරුවන් විසින් මුහුණ දෙන ප්‍රායෝගික ගැටළුයි. ඒ සඳහා ඔහු විසින් නව නිර්මාණ කිහිපයක් නිෂ්පාදනය කරනු ලැබීය.**

**මින් එක් නිර්මාණයක් වන්නේ තෝරා තේ දළු නෙලනයයි. (Selective Tea Harvester)**

ශ්‍රී ලංකාවේ තේ දළු නෙලීම මූලික වශයෙන් සිදුවන්නේ කම්කරු ශ්‍රමය උපයෝගී කොට ගෙනය. වර්තමානයේ මේ සඳහා විශාල ශ්‍රම අවශ්‍යතාවයක් ඇත. (හෙක්ටයාරයකට කම්කරුවන් 10-12 පමණ) පවතින ශ්‍රම හිඟය නිසා බොහෝ තේ ඉඩම්වල දළු නෙලීම නිසියාකාරව සිදු නොවන නිසා අස්වැන්න අඩුවීමත්, නිෂ්පාදනයේ ගුණාත්මකභාවය පහත වැටීමත් සිදුවේ. මෙම තත්ත්වය නිසා තේ කර්මාන්තයෙන් ශ්‍රී ලංකාවට නිසි ඵල ලබාගැනීමට නොහැකි තත්ත්වයක් උදාවී ඇත. මේ තතත්වයට පිළියමක් ලෙස තේ දළු නෙලීමට හැකි කුඩා අත් යන්ත්‍රයක් ඔහු විසින් නිපදවීය.

සෙ.මී. 20 x 20 x 5 ප්‍රමාණයේ කුඩා ප්ලාස්ටික් පෙට්ටියක කෙළවර පතුලේ සිට සෙ.මී. 2.5 පමණ ඉහළින් සවි කරන ලද වානේ තල 2 ක් හා එහි ඉහළින් පිහිටි තලයට සම්බන්ධ කරන ලද ප්ලාස්ටික් හැඬලයක් උපයෝගීකර ගෙන මෙම නව නිර්මාණය සිදුකර ඇත.

ප්ලාස්ටික් පෙට්ටියේ පතුල සිදුරුකර ඇති බැවින් දළු සමඟ එකතුවන ජලය ඉන් බැහැර කරයි. කතුරක් ක්‍රියාකරවන ආකාරයෙන් පෙට්ටියේ කෙළවර එක් අතකින්ද, හැඬලය තවත් අතකින්ද අල්ලා කතුරක් ආකාරයෙන් ක්‍රියා කිරීමෙන් දළු නෙනීම් සිදුකරයි. මෙමගින් කැපෙන දළු පෙට්ටියට එකතුවන අතර, තලය සෙ.මී. 2.5 ක් පමණ ඉහළින් සවිකර ඇති නිසා කුඩා දළු කැපීම සිදු නොවේ.

මීට අමතරව අවශ්‍ය ප්‍රමාණයේ දළු දෙසට පමණක් කතුරේ කැපෙන කොටස යොමු කිරීම තුළින්ද කුඩා තේ දළු පහසුවෙන් ඉතිරි කර ගැනීමට පුළුවන.



මෙම දළු නෙලනය භාවිත කිරීමෙන් අතින් දළු නෙලන කම්කරුවන්ගේ දළු නෙලීමේ ප්‍රමාණය 50 සිට 100 දක්වා ඉහළ නැංවීමට හැකිවන අතර, දළු නෙලීමට අවශ්‍ය වන ශ්‍රමයද ඒ අනුව අඩුකර ගත හැකිය. කැඩෙන දළු පොඩි නොවීමත්, පඳුරේ මට්ටම ඉතා හොඳින් පවත්වා ගැනීමට හැකිවීමත් මෙහි ඇති අමතර වාසි අතර වේ.

**ඕනෑම නව නිර්මාණයක් කරනු ලැබූ නව නිර්මාණකරුවාට සිය නිර්මාණයේ බුද්ධිමය දේපල අයිතිය ලබාගැනීමට නීතියෙන් ඉඩප්‍රස්ථා ලැබී ඇත. ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය මගින් 1997 වසරේදී මෙම නිර්මාණය සඳහා ආචාර්ය විජේරත්නයන්ට පේටන්ට් බලපත්‍රය ප්‍රදානයකර ඇත. (පේටන්ට් බලපත්‍ර අංකය - 11206) පේටන්ට් බලපත්‍රය ලබාගැනීමෙන් අනතුරුව ඕනෑම නව නිර්මාණයක් පාරිභෝගිකයන් සඳහා වෙළඳපොළට විවෘත වේ. අචාර්ය විජේරත්නයන් විසින් මෙම තේ දළු නෙලනය වාණිජකරණය කරමින් දේශීය වෙළඳපොළට හඳුන්වාදුන් අතර. දැනට ශ්‍රී ලංකාවේ වෙළඳපොළ පමණක් නොව විදේශ රටවල් වලින්ද මේ සඳහා ඇණවුම් ලැබී ඇත.**

**මෙම නිර්මාණය සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් 1998 වසරේදී ජනාධිපති සම්මානයක් ප්‍රදානය කළ අතර. එම**

**වසරේදීම ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවර වාර්ෂිකව පවත්වනු ලබන අන්තර්ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය සඳහා කොමිසම මගින් මෙම නිර්මාණය ඉදිරිපත් කළ අතර, ඒ සඳහා රන් පදක්කමක් සහ සහතිකයක් හිමිකර ගැනීමට හැකියාව ලැබිණි.**

ආචාර්ය විජේරත්නයන් විසින් හඳුනාගත් තවත් එක් ගැටළුවක් වන්නේ තේ දළු නෙලන කම්කරුවන් විසින් ප්‍රායෝගිකව අත්විඳින දළු එකතුකිරීමේ ගැටළුවයි. තේ දළු එකතු කිරීම සඳහා සාම්ප්‍රදායිකව කම්කරුවන් භාවිත කරන්නේ බට පොතු හෝ වේවැල් වලින් සකස් කරන ලද කූඩයකි.



මෙය ලණුවක ආධාරයෙන් හිසේ රඳවා ගෙන දළු නෙලීම සිදු කරයි. තවත් සමහරු මෙවැනි කූඩ වෙනුවට හිස් පොහොර මළු භාවිත කරන බව අප බොහෝ අවස්ථාවලදී දැක තිබේ. මෙහිදී මෙම දළු බහාලනයේ හිස විවෘත වී නොමැත. මෙවැනි විවෘත නොවූ දළු ගෝනි භාවිත කර දළු නෙලීමේදී කාර්යක්ෂමතාව අඩුවෙනවා මෙන්ම අධික උෂ්ණත්වය හා වාතාශ්‍රය හිඟවීමෙන් දළු වලට හානි සිදුවේ. ඒ වගේම තේ දළු නෙලීම සඳහා හඳුන්වා දී ඇති කතුරු ආදිය භාවිත කිරීමේදී යෝග්‍ය කූඩයක් නොමැතිකම විශාල බාධාවක්ව පවතී. මෙම බාධක තේරුම්ගත් ආචාර්ය විජේරත්න නවතම දළු එකතු කිරීමේ උපකරණය නිර්මාණය කළා. මෙහි විශේෂ ලක්ෂණ කිහිපයකි,

- සැහැල්ලු බව
- හකුලා ගෙනයා හැකි බව
- පහසුවෙන් භාවිත කළ හැකි බව
- ඉහළ කොටස වඩාත් විවෘතව ඇති නිසා කූඩය තුළට පහසුවෙන් දළු දැමිය හැකි වීම
- දිගු කලක් භාවිත කළ හැකිවීම



මෙම පහසුකම් සහිතව නිර්මාණයකර ඇති සැහැල්ලු තේ කූඩය P.V.C. බට උපයෝගී කරගෙන හැකිලිය හැකි ආකාරයට නිර්මාණයකර තිබේ. P.V.C. බට වලින් සකස්කර ඇති සැකිල්ල සරනේරුවක ආකාරයට හැකිලීමට හැකි අයුරින් පහත කොටස සම්බන්ධකර තිබේ. එම සැකිල්ලේ ඉහළින් එල්ලා ගැනීම සඳහා දැල් සහිත දළු මල්ලක් සපයා ඇත. මෙය දළු වලින් පිරිගිය විට ඉවත්කර අළුත් බෑගයක් කූඩයට එල්ලා ගැනීමට හෝ එම දළු මල්ලම නැවත භාවිත කළ හැකිය. දළු කූඩයේ පහත කොටස පටු නිසාත්, ඉහළින් හොඳින් විවෘතව පවතින නිසාත්, තේ ඉඩම්වල පේළි අතර පහසුවෙන් ගමන් කිරීමටත්, නෙලන දළු කූඩය තුළට පහසුවෙන් දැමීමටත් හැකියාව ඇත. මෙම කූඩය සාමාන්‍ය කූඩයකට වඩා විශාල ලෙස බරින් අඩු නිසා සාමාන්‍ය පොත් බෑගයක් සේ උරහිසින් පිටේ එල්ලා ගතහැකි නිසා භාවිතයට ඉතා පහසුය. හැකිලීමට හැකි අයුරින් නිමවා ඇති නිසා ගබඩා කිරීමේදී හා ප්‍රවාහනයේදී ගැටළු මතු නොවේ. P.V.C. බට වලින් තනා ඇති බැවින් එය දිගු කලක් භාවිත කිරීමටද පුළුවන.

**ආචාර්ය විජේරත්න මෙම හකුලන කූඩය සඳහා 2002 වසරේදී පේටන්ට් බලපත්‍රය ලබාගත් අතර, (12519) එය දේශීය වෙළඳපොළ සඳහා නිෂ්පාදනයකර අළෙවි කිරීමට කටයුතු යොදා ඇත.**

තේ කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතාව රඳා පවතින එක් සාධකයක් නම් නිවැරදි ලෙස, නිවැරදි අකාරයට හා නිසි කාලයට තේ පඳුරු කප්පාදු කිරීමයි. ශ්‍රී ලංකාවේ තේ පඳුරු කප්පාදු කිරීම මූලික වශයෙන් සිදුකරනු ලබන්නේ කප්පාදු පිහි ආධාරයෙනි.

මේ සඳහා විශාල ශ්‍රමයක් (හෙක්ටයාරයකට කම්කරුවන් 40-60 ත් අතර) අවශ්‍ය වේ. පුහුණු කම්කරු හිඟය හේතුවෙන් තේ කප්පාදු කිරීමද නිසියාකාරව සිදු නොවන අතර, එය තේ පඳුරුවල වර්ධනයට අහිතකර බලපෑම් ඇතිකරයි. මේ සඳහා දැනට සාමාන්‍ය කැලෑ පඳුරු කපන යන්ත්‍රය (bush cutter) භාවිත කිරීමට ඉඩම් හිමියන් පෙළඹී ඇතත් ඒවායේ අධික මිලත්, නිර්දේශිත ආකාරයට ශේෂ කප්පාදුව සිදු කිරීමට නොහැකිවීමත් නිසා ගැටළුවලට මුහුණපෑමට සිදුව ඇත. මෙයට පිළියමක් ලෙස ආචාර්ය විජේරත්නයන් පහසුවෙන් හැසිරවීමට හැකි කුඩා අතු කපන යන්ත්‍රය නිපදවීය.

මෙම යන්ත්‍රය විදුලි බලයෙන් ක්‍රියාකරන මෝටරයකට සවිකරන ලද දැති සහිත කවාකාර තලයකින් යුක්තයි. විදුලි මෝටරයට සවිකරන ලද ගියර් මගින් මිනිත්තුවකට වාර 10,000 ක් පමණ වේගයක් තලයට ලැබෙන බැවින් අතු පහසුවෙන් කැපීමට පුළුවන. මීට අමතරව හැඩලයට සම්බන්ධ විශේෂ පේනුවක් තලයේ කොටසක් ආවරණය වන පරිදි සවිකර ඇති ආවරණයත් කප්පාදු යන්ත්‍රය අසලින්ම විදුලිය සපයන කේබලය විසන්ධි කළ හැකි අයුරින් නිමවා තිබීම නිසාත් භාවිතයට පහසුවන අතර,

යන්ත්‍ර ක්‍රියාකරුගේ ආරක්ෂාවද තහවුරුකර ඇත. අතේ ගෙනයා හැකි ජෙනරේටරයක් භාවිත කිරීමෙන් කප්පාදු යන්ත්‍ර 2-3 කට විදුලිය ලබාගැනීමට පුළුවන. ඒ සඳහා භාවිතකර ඇති මීටර් 50 ක් පමණ දිග කේබලය නිසා අතින් පහසුවෙන් ක්‍රියාකරවිය හැකිය. මෙමගින් තේ අතු නොපැලී අවශ්‍ය උසකින් තෝරා බේරා පහසුවෙන් කපා ඉවත් කළ හැකිය.

මෙම යන්ත්‍රය භාවිතයෙන් කප්පාදු කරන කම්කරුවකුගේ කාර්යක්ෂමතාව තුන් හතර ගුණයකින් වැඩිකර ගැනීමට පුළුවන. ඒ වගේම එකම ජෙනරේටරයක් භාවිත කිරීමෙන් යන්ත්‍ර කිහිපයක් ක්‍රියාකරවිය හැකි නිසා කප්පාදුව සඳහා යන වියදම විශාල ලෙස අඩුවේ.



මෙම යන්ත්‍රය තේ සඳහා පමණක් නොව කුරුඳු හා වෙනත් උද්‍යාන භෝග සඳහා ද භාවිත කළ හැකිය.

**2001 වසරේදී මෙම යන්ත්‍රය සඳහා පේටන්ට් බලපත්‍රය ලබාගෙන ඇති අතර, (12345) නුදුරු අනාගතයේදී තේ කර්මාන්තකරුවන් හා තේ වතු හිමියන් වෙත මෙය හඳුන්වාදීමට ආචාර්ය විජේරත්නයන් බලාපොරොත්තු වේ.**

මොහු වැනි දේශීය නව නිපැයුම්කරුවන් දේශීය ආර්ථිකය නංවාලීම සඳහා මහත් උත්සාහයෙන් වැඩ කිරීමට කැපවී සිටී. එය ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට හොඳ ආදර්ශයකි.

ආචාර්ය විජේරත්නයන් ගෙන් තේ කාර්මාන්තයේ නිරත ඔබට යම් උපකරණයක් පිළිබඳව හෝ යම් තොරතුරක් හෝ උපදේශයක් ලබාගැනීමට අවශ්‍ය වන්නේ නම් ඔහුගේ ලිපිනය හා දුරකථන අංක මෙසේය.

**තේ පර්යේෂණ ආයතනය**
**රත්නපුර**
**දුරකථන**: 045 2228851
**ෆැක්ස්** : 045 2228628
**ඊ-මේල්** : triagro@sol.lk
madawalawije@yahoo.co.uk

**රටක ඵලදායිතාව මනින එක් මිණුම්දණ්ඩක් ලෙස නව නිපැයුම් හැඳින්වුවහොත් එම ඵලදායිතාව වර්ධනය කිරීමට මූලික වන්නේ නව නිපැයුම්කරුවන්ය.**

**ලෝකයේ දියුණු යයි සලකනු ලබන ජපානය, චීනය, කොරියාව, ඇමෙරිකාව ආදී රටවල සංවර්ධනයේ මූලික රහස නව නිපැයුම් බව නොරහසකි. සිය ශ්‍රමය, ශක්තිය, බුද්ධිය හා හැකියාව මිශ්‍ර කොට නිර්මාණය කරනු ලබන නිෂ්පාදනය දේශීය මෙන්ම විදේශීය වශයෙන් වෙළඳපොළ සොයාගැනීම තුළින් ඔවුන් ඒ ඒ රටවල දියුණුව සාක්ෂාත් කරගෙන ඇත. එහෙත් ශ්‍රී ලංකාවේ තත්ත්වය එසේ නොවේ. නව නිපැයුම්කරුවන් දේශයට සම්පතක් ලෙස සලකමින් ඔවුන් දිරිමත් කිරීම අප කාගේත් යුතුකමක් හා වගකීමක් වේ.**

**මේ සඳහා නිර්මාණශීලී සමාජ සම්ප්‍රදායක් සමස්ත සමාජය තුළම ස්ථාපිත කළ යුතුව ඇත. ඒ සඳහා රජයේ පූර්ණ දායකත්වය ලබාදීම තුළින් දේශීය නව නිපැයුම්කරුවන් නඟාසිටුවිය හැකි බව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ විශ්වාසයයි.**

අනාගත ශ්‍රී ලංකාවේ දියුණුවට දේශීය නව නිර්මාණ තුළින් හැකියාව ලැබේවායි අපි ප්‍රාර්ථනය කරමු.

**විද්‍යුත් ලෝහාලේපන සේවා**

**ELECTROPLATING SERVICES**

available on

- Bright Nickel Plating
- Bright Chromium Plating
- Zinc Electroplating
- Hard Chromium Plating

for your specific requirements and further details

*Contact:*

Chief Engineer
Industrial Development Board
Tel: 2605490 Fax: 2607002